මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: 2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513459, 2513498, 2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: 2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2018.09.20

**ප්‍රවෘත්ති නිවේදනයයි**

**සීනිවල ආනයනික පිරිවැය තවදුරටත් අඩුවෙයි**

ලෝක වෙළෙඳපොලේ පවත්නා අධික සැපයුම හේතුවෙන් මෙරටට සීනි ආනයනය කිරීමේදී එහි පිරිවැය මේ වනවිට කිලෝග්‍රෑමයකට රු. 52 දක්වා අඩුවී තිබේ.

ඉන්දියාව, තායිලන්තය හා බ්‍රසීලය වැනි රටවල අධික අස්වැන්න හේතුවෙන් සීනි සැපයුම් මේ වනවිට බෙහෙවින් වැඩි වී තිබේ. 2018 සැප්තැම්බර් මාසය දක්වා මෙරටට ආනයනය කරන ලද සීනි කිලෝග්‍රෑමයක පිරිවැය වූයේ රු. 63/- ක් පමණි. එහෙත්, එය ක්‍රමයෙන් අඩුවී අද වනවිට සීනි කිලෝග්‍රෑමයක ආනයනික පිරිවැය රු. 52/- දක්වා අඩුවී තිබේ.

ශ්‍රී ලංකාවේ වසරකට මෙට්‍රික් ටොන් ලක්ෂ හයක් පමණ සීනි පරිභෝජනයක් පවතියි. එයින් මෙ.ටොන් 50,000 ක් පමණ දේශීය වෙළෙඳ පොලින් සැපයේ.

ලෝක වෙළෙඳ ප්‍රවණතාවය හේතුවෙන් කිලෝග්‍රෑමයක් සඳහා රු. 52/- වන අඩු පිරිවැය සහිත සීනි මෙ.ටොන් 22,000 ක් පමණ මේ වනවිට මෙරටට ආනයනය කර තිබෙන බැවින් නව බදු පැනවීම මධ්‍යයේ වුවද සීනි මිල වැඩි කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැත.

සීනි කිලෝවක ආනයනික මිල රු. 76 ක උපරිමයට තිබියදී අයකරන ලද රු. 31 ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද වෙනුවට සියළු බදු සහිතව ඊයේ සිට රු. 42/- ක් අයකළද සීනි කිලෝවක ආනයනික පිරිවැය රු. 51/- දක්වා අඩුවී ඇති බැවින් සීනිවල විකුණුම් මිලෙහි කිසිදු වෙනසක් නොවිය යුතුයි යන්න රජයේ ස්ථාවරයේ කිසිදු වෙනසක් නොමැත.

එම්. අලි හසන්
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය